**ගාලු උරුමය පදනම - 2019**
**---------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය
**------------------------------**

ගාලු උරුමය පදනමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ගාලු උරුමය පදනමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොමැති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
**-----------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ගාලු උරුමය පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ගාලු උරුමය පදනම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ගාලු උරුමය පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ගාලු උරුමය පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ගාලු උරුමය පදනම වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

--------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ගාලු උරුමය පදනමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ගාලු උරුමය පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ගාලු උරුමය පදනමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව පදනම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගණුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගණුදෙනු සටහන් කිරීම හා වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වටිනාකම රු.1,374,265 ක් වූ ගණුදෙනු වලට අදාළව නිරීක්ෂණය වූ වෙනස්කම් සැසඳීමට කටයුතු නොකර සම්මුච්චිත අරමුදලට ලියා හැර තිබුණි. එම නිසා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු සමුච්චිත අරමුදල් ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. | සමුච්චිත අරමුදලෙන් කපා හැර නොතිබුණි. | සමුච්චිත අරමුදලෙන් ලියා හැරීමට පෙර එම ගණුදෙනු පිළිබඳව පරීක්ෂා කර වෙනස්කම් සැසඳීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දක්වා තිබූ රු.1,027,911 ක් වූ රඳවා ගැනීම් ශේෂයට අදාල විස්තරාත්මක ලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | පොදු ලෙජරයේ විස්තරාත්මක සටහන ඉදිරිපත් කරමි. | ජංගම වත්කම් යටතේ ඇති ශේෂයට අදාළ විස්තරාත්මක ලේඛන මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා වන පාරිතෝෂික වෙන් කිරීම රු.605,916 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | ඌන වෙන් කිරීම නිවැරදි කිරීමට කටයුතු කරමි. | පාරිතෝෂික සඳහා නිවැරදි අගය වෙන් කිරීම කළ යුතුය. |
| (ඈ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ අමාත්‍යාංශයෙන් ලද ප්‍රදාන රු.800,732 ක් හා ලබා දුන් සේවක ණය රු.122,777 ක් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | නිවැරදි ශේෂයන් ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| ස්ථාවර වත්කම් | 40,900,661 | (i) ස්ථාවර වත්කම් සත්‍යාපන වාර්තා<br>(ii) යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛන | ඉල්ලා ඇති තොරතුරු ඉදිරියේදී ඔබ වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත. | මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති ජංගම නොවන වත්කම් ශේෂයන්ට අදාළව යාවත්කාලීන කරන ලද නිවැරදි ලේඛනයන් ඉදිරිපත් කළ යුතුය. |
| තොගය | 792,865 | (i) තොග හා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා<br>(ii) යාවත්කාලීන කරන ලද තොග ලේඛනය | - එම - | තොග ශේෂයට අදාළ තොග ලේඛනය හා සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.5.4 නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි අංක 756 | වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණය සිදු කළ යුතු වුවද, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් රේඛීය අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ සිදුකර ඇත. 2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය, 2020 වර්ෂයේ මාර්තු මස සිදු කරන ලදී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පී.ඊ.ඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය ප්‍රකාර | ත්‍රෛමාසිකව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත්, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | 2003/06/02 දිනැති පී.ඊ.ඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ප්‍රකාරව විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් පැවැත්විය යුතු බව පිළිගන්නා අතර ගාලු උරුමය පදනම විසින් එහි රේඛීය අමාත්‍යාංශය විසින් පවත්වන විගණන හා කළමණාකරන කමිටු වෙත සහභාගී වීම නිසි පරිදි සිදුකර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතුය. |
| (ඇ) 1994 අංක 07 දරන ගාලු උරුමය පදනමේ පනතේ 16 වන වගන්තිය | පසුගිය වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | කාර්යසාධන වාර්තාව නියමිත දිනට සකස් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු.3,956,108 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.223,182 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,179,290 ක් හෙවත් සියයට 1873 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ ආකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගාලු උරුමය පදනම සඳහා නව වෙබ් අඩවියක් සැකසීම වෙනුවෙන් රු.300,000 ක් වූ මුදලකට සැපයුම්කරුවකු තෝරා ගෙන තිබූ අතර 2018 වර්ෂයේදී රු.224,250 ක්ද 2019 වර්ෂයේ රු.273,515 ක් ගෙවා තිබුණි. වෙබ් අඩවිය සැකසීම සඳහා රු.300,000 කට එකඟ වී තිබුණද, අනුමැතියකින් තොරව 2019 දෙසැම්බර් 31 දින වන විට රු.497,765 ක් ගෙවා තිබුණි. වෙබ් අඩවිය සැකසීමේ කාර්යය නිම කර නොතිබූ අතර ප්‍රසම්පාදන වටිනාකම ඉක්මවා රු.197,765 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | 2019 වර්ෂයේ දෙසැම්බර් මස ආරම්භයේ දී වෙබ් නිර්මාණ කටයුතු අවසන්ව තිබූ අතර, රඳවා ගැනීම් නිදහස් කළ පසුව සමස්ත පිරිවැය "ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක (LKAS) 38 - අස්පෘශ්‍ය වත්කම්" යටතේ ගිණුම්ගත කිරීමට යෝජිතය. | එකඟ වූ මුදල ඉක්මවා ගෙවීම් සඳහා අනුමැතිය ලබා ගත යුතුය. |
| (ආ) | ගාල්ල කොටුවේ කෆා වැසිකිළි පද්ධතිය වාස්තු විද්‍යාත්මක වටිනාකමට සරිලන පරිදි නවීකරණය කිරීම සඳහා 2019 මාර්තු 21 දින රු.6,932,275 ක ගිවිසුම්ගත මුදලකට කොන්ත්‍රාත්කරුවෙකුට භාර දී තිබුණු අතර ගිවිසුමට අනුව ඉදිකිරීම් කටයුතු 2019 මාර්තු 25 දින ආරම්භ කර 2019 අගෝස්තු 26 දින නිම කළ යුතුව තිබුණි. එසේ වුවත්, 2020 ජනවාරි මස අවසානය දක්වාම ඉදිකිරීම් කටයුතු නිමකර නොතිබුණු නමුත්, ඉදිරිපත් කළ බිල්පත් සඳහා රු.4,348,387 ක් ගෙවීම් කර තිබුණි. | මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු සැකසීමට නිශ්චිත ආයතනයක් හෝ පුද්ගලයෙකු ගාලු උරුමය පදනම සතුව නොමැති වීම නිසා 2017 වර්ෂය අවසාන කාර්තුව තුළ මෙම ඉලක්කය සපුරා ගැනීමට නොහැකි විය. මෙම හේතුව නිසා 2018 දී CECB හි කරාපිටිය ශාඛාව මෙම ඉදිකිරීම්වල උපදේශක ලෙස කළමනාකරණ මණ්ඩල අනුමැතියට යටත්ව තෝරා ගන්නා ලදී. ඒ අනුව ඔවුන් විසින් අදාළ ලංසු ලේඛන සකසා 2018 මාර්තු 08 භාරදුන් අතර අප විසින් 2018 මාර්තු 09 වන දිනට ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර කොන්ත්‍රාත්කරුවකු තෝරා ගන්නා ලදී. ව්‍යාපෘතිය සිදු කර ගෙන යාමේදී යම් ප්‍රමාදයක් සිදු වී ඇති අතර ඒ සඳහා ගාලු උරුමය පදනම අවස්ථා කිහිපයකදී රේඛීය අමාත්‍යාංශ කිහිපයකට මාරු වීමද හේතු විය. | අදාළ කාර්යය නියමිත වේලාවට නිම කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගාලු උරුමය පදනමට අවශ්‍ය බලතල ලබා ගැනීමට හා පදනම සඳහා ආදායම් උත්පාදනය නංවාලීමේ යන අරමුණු සඳහා 1994 අංක 7 දරන ගාලු උරුමය පදනම පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඒ සඳහා 2015 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල සංදේශයක් පිළියෙල කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් එම පනතේ සංශෝධනයන් සිදු කර නොතිබුණි. | ගාලු උරුමය පදනම අවස්ථා කීපයක දී විවිධ රේඛීය අමාත්‍යාංශයන් යටතේ පැවැති අතර ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ද පැවැතිණි. එබැවින් එම සංශෝධන කාර්යය නිසි පරිදි සාර්ථක කර ගැනීමට නොහැකි විය. කෙසේ වුවත් වත්මන් අමාත්‍යාංශය යටතේ හෝ මෙම කාර්යය ඉටු කරවා ගැනීමට අපේක්ෂා කරමි. | පනත සංශෝධනය කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගාල්ල කොටුවේ සඳුු මුර අට්ටාලයේ පිහිටි පැරණි ලන්දේසි යුධ කාමරය සංරක්ෂණය කර ගාල්ලේ ඓතිහාසික උරුමය පිළිඹිබු කරන ප්‍රදර්ශන ගැලරියක් බවට පත් කිරීමට 2016 වර්ෂයේදී කැන්වස් සිතුවම් 16 ක් ඇඳීමට රු.1,520,000 ක් වැය කර සිතුවම් ලබා ගෙන තිබුණු නමුත්, එම සිතුවම් මෙම වාර්තාවේ දිනය දක්වාම වසර 6 කට වැඩි කාලයක් තුළ කාර්ය ඉටුකිරීමකින් තොරව පදනමේ කාර්යාල පරිශ්‍රයේ නිෂ්කාර්යව තබා තිබුණි. | සඳුු මුර අට්ටාලය හැර අනෙකුත් මුර අට්ටාල සියල්ලම ලෝක බැංකු ආධාර ව්‍යාපෘති යටතේ සංචාරකයන්ට අත්දැකිම් ලබාදෙන විවිධ ගැලරි සහ කෞතුකාගාර බවට පත්වන අතර, සඳුු යුධ කාමරය, ළමුන් සඳහා වන විශේෂ ගැලරියක් ලෙස සංවර්ධනය කිරිමට තීරණය විය. ඒ අනුව ගැලරියේ ආරම්භක තේමාව සංශෝධනයට ලක්විය. ඒ අනුව සිතුවම් 16 සහ ප්‍රතිමා 12 ට අදාලව ඓතිහාසික කථා මාලාව තවදුරටත් දියුණු කරමින් ළමුන්ට වඩාත් ආකාර්ශණීය වියහැකි පරිදි කාටුන් හැඩයගත් අර්ථකථන සිතුවම්ද එකතු කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. එසේම එම ගැලරියේ ඇතැම් කටයුතු ලෝක බැංකු ව්‍යාපෘති යටතේ සිදු කිරිමට ද නියමිතය. | වැය කරන ලද මුදල නියමිත කාර්යයන්ට යොදවා ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වායු සමීකරණ යන්ත්‍ර 2 ක් සවිකිරිම හා එහි විදුලි රැහැන් වැසීමට ලී රාමු යෙදීම සඳහා එකතු වටිනාකම වූ රු.1,013,005 ක් 2015 වර්ෂයේදී වැය කර තිබුණු නමුත්, 2020 ජුනි 15 විගණිත දිනය වන විටත් මෙම මැදිරියේ වැඩ කටයුතු අවසන් නොකිරීම හේතුවෙන් එම යන්ත්‍ර භාවිතයට නොගෙන නිෂ්කාර්යව තිබුණි. | මෙම යුධ කාමරයේ විවිධ ප්‍රදර්ශන වලට භාවිතා කිරීමේ දී සහ සංචාරකයන් සඳහා දෛනිකව විවෘත කරන අවස්ථාවේ දී වායු සමීකරණ යන්ත්‍ර භාවිතා කරනු ලබයි. මෙහි තාවකාලිකව අප්‍රිකානු වහලුන්ගේ ඓතිහාසික තොරතුරු ඇතුළත් ප්‍රදර්ශන මැදිරියක්ද පවත්වාගෙන යාම සඳහා ද භාවිතා කරනු ලැබීය. කොවිඩ් 19 කාල සීමාව තුළ ගැලරිය වසා තිබීම නිසා එක් වායු සමීකරණ යන්ත්‍රයක් අක්‍රීය වන්නට ඇති බව අපගේ අදහසයි. ඉදිරි මාස කිහිපය තුළ මෙම ගැලරියේ කටයුතු අවසන් කිරීමට යෝජිතය. කැන්වස් සිතුවම් 16 ද, ගැලරිය විවෘත කරන විට ළමා සිතුවම් සමඟ ප්‍රදර්ශනය කරනු ඇත. | මැදිරියේ වැඩ කටයුතු නිමකර වායු සමීකරණ යන්ත්‍ර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රධාන විධායක නිලධාරී, පරිපාලන නිලධාරී, ව්‍යාපෘති සහකාර තනතුර 06 ක් හා ආරක්ෂක නියාමක තනතුරු 02 ක පුරප්පාඩු පැවතියද, එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණු අතර 1994 අංක 07 දරන ගාලු උරුමය පදනම පනත යටතේ ගාලු උරුමය පදනම පිහිටුවා වසර 15 ක් ගත වී ඇතත් වර්තමානයේ පදනමේ පරිපාලන නිලධාරී තනතුර සඳහා 2006 ජනවාරි 02 දින සිට කොන්ත්‍රාත් පදනම මත නිලධාරීනියක් බඳවා ගෙන වාර්ෂිකව කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරමින් වර්ෂ 14 කට වැඩි කාලයක් සේවයේ යොදවා තිබුණි. | අධ්‍යක්ෂ හා පරිපාලන නිලධාරි තනතුරු සඳහා ස්ථිර ලෙස නිලධාරීන් බඳවා ගැනිමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වා සිටිමි. ව්‍යාපෘති සහකාර තනතුරු 06න් දැනට තනතුරු 04ක් සඳහා රේඛීය අමාත්‍යංශයෙන් නිළධාරීන් අනියුක්ත කොට ඇත. ඉදිරි අවශ්‍යතා අනුව ව්‍යාපෘති සහකාර තනතුරු සහ ආරක්ෂක නියාමක තනතුරු සඳහා බඳවා ගැනීමට ක්‍රියා කරනු ඇත. | පුරප්පාඩු විධිමත්ව පුරවා ගැනීමට කටයුතු කළ යුතුය. |